# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 66 දරන
# මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ඔක්තෝබර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ඔක්තෝබර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 90 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 1981 ඔක්තෝබර් මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 34/81

**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

කොළඹ, ප්‍රසිද්ධ නොතාරිස් මල්ලවාරච්චිගේ හර්මන් පැට්‍රික් පෙරේරා විසින් සහතික කරන ලද සහ මෙහි උපලේඛනයෙහි දක්වා ඇති (මෙහි මින් මතු "ඔප්පුව" යනුවෙන් සඳහන් කරනු ලබන) අංක 2773 දරන භාර ඔප්පුව මගින්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ උන්නතිය සඳහා "මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන අරමුදලක් දැනට පිහිටුවා ඇති හෙයින් ද :

තව ද, එකී භාර අරමුදලෙහි අරමුණු සහ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ප්‍රමාණවත් මුදල්, පොදු සහ පෞද්ගලික පරිත්‍යාග මගින් සාර්ථක ලෙස එකතු කර ගෙන ඇති හෙයින් සහ මෙහි මතු දක්වා ඇති විධිවිධානවලට අනුව, එකී භාර අරමුදල සංස්ථාගත කිරීම සඳහා භාරකරුවන් විසින් ඉල්ලීමක් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩදීම පොදු යහපතට හේතුවන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සංස්ථාගත කිරීම.**

**2.** මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල, මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් සියලු අධිකරණවල ඒ අරමුදල විසින් නඩු පැවරීම ද, අරමුදලට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකිය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ සම්පූර්ණ බලය සහ අධිකාරය ද ඒ අරමුදලට තිබිය යුතු ය.

**අරමුදලෙහි භාරකාර මණ්ඩලය.**

**3.** (1) අරමුදල පිළිබඳ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි සමන්විත වන භාරකාර මණ්ඩලයක් වෙත භාර විය යුතු ය.

(2) මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන, අරමුදලෙහි භාරකාර මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) ප්‍රාරම්භක ;

(ආ) තත් කාලයෙහි—

(i) ශ්‍රේෂ්ඨාධිකරණයෙහි අග්‍ර විනිශ්චයකාරවරයා ;

(ii) උසස් අධ්‍යාපනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයා ;

ඒ 58288—12,950 (81/09)

(iii) අධ්‍යාපනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයා ; සහ

(iv) වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයා

ලෙස ධුරය දරන තැනැත්තෝ ; සහ

(ඇ) ප්‍රාරම්භක විසින් අවුරුදු පහක කාලසීමාවක් සඳහා පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් දෙදෙනෙක් :

එසේ වුවද, ඔප්පුවේ 11 වන ඡේදයෙහි සඳහන් තැනැත්තන් නොවන, දැනට සිටින භාරකරුවන් දෙදෙනා මේ පනත යටතේ, මුලින්ම පත් කළ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ පළමුවන සහ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ සාමාජිකයන් අතුරින් කෙනකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතු ය.

(4) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක දී දිසාපතිවරයා වෙත ලියවිල්ලකින් කරනු ලබන දැනුම්දීමක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(5) යම් තැනැත්තකු—

(අ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක හෝ බලපවත්වන යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත් හෝ බුන්වත් හෝ තැනැත්තකු ලෙස ප්‍රකාශ කරනු ලැබ, නිදහස් කරනු නොලැබූ වස්තුභංගත්වයට පත් හෝ බුන්වත් හෝ තැනැත්තකු වේ නම් ; හෝ

(ආ) චරිත දූෂණය පිළිබඳ සහ හය මාසයකට නොඅඩු කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදකට වරදකරු වී තිබේ නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවෙහි බලපවත්වන යම් නීතියක් යටතේ සිහිවිකල් හෝ මන්දබුද්ධික තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ තිබේ නම්

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ තවදුරටත් ධුරයේ කටයුතු කිරීමට හෝ සුදුසු නොවිය යුතු ය.

(6) ස්වකීය ධුර කාලය ඉකුත්වීමට පෙර, මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු මිය යාම නිසා, ඉල්ලා අස්වීම නිසා හෝ වෙනත් ආකාරයකින් හෝ තම ධුරය හිස් කළහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

(7) මණ්ඩලයේ සෑම රැස්වීමක ම මූලසුන, මණ්ඩලයේ සභාපතිවරයා විසින් දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ සාමාජිකයන් අතුරින් ඒ රැස්වීම සඳහා සභාපතිවරයකු තෝරා පත් කර ගත යුතු ය.

(8) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් මතභේදයක් උද්ගත වූ විට, බහුතර තීරණය අනුගම්‍ය සහ බලාත්මක විය යුතු ය.

(9) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක්, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත ලෙස නොසැලකිය යුතු ය.

(10) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

(11) මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පටිපාටිය ද, ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම ද විධිමත් කිරීම සඳහා මණ්ඩලය විසින්, (10) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, රීති සාදනු ලැබිය හැකි ය.

4. අරමුදලේ මුද්‍රාව— අරමුදලේ මුද්‍රාව.

(අ) මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ ආරක්ෂිත භාරයේ තැබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය; තව ද

(ඇ) මණ්ඩලයේ අනුමතය ඇතිව මිස හා මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස යම් ලේඛනයකට නොතැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඒ ලේඛනය අත්සන් කළ යුතු ය.

5. අරමුදලෙහි අරමුණු සහ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය:— අරමුදලේ අරමුණු සහ පරමාර්ථ.

(අ) යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම;

(ආ) සතුටුදායක ලෙස තම ද්විතීය අධ්‍යාපනය සම්පූර්ණ කර සිටින, ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට තමන්ගේ ශාස්ත්‍රීය, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපනය අවස්ථාවෝචිත පරිදි, විශ්ව විද්‍යාලයක හෝ කාර්මික නැතහොත් උසස් අධ්‍යාපන ආයතනයක සම්පූර්ණ කිරීමට හැකි වන පරිදි ඔවුන්ට ආධාර සැලසීම;

(ඇ) යෞවනයන්ට තමන්ගේ වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි, වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහායවීම;

(ඈ) අධ්‍යාපනය සැලසීමෙහි ලා නිරතව ඇති පාසල්, ආයතන, පදනම් සහ වෙනත් එවැනි ආයතන පිහිටුවීම සහ ඒවා කළමනාකරණය කිරීමෙහි ලා සහ පවත්වා ගෙන යාමේ ලා සහායවීම; සහ

(ඉ) අධ්‍යාපනය සැලසීමෙහි ලා නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලසීම.

මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය.

6. (1) අරමුදලේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමේ ලා අවශ්‍ය වන හෝ හිතකර වන හෝ ආනුෂංගික වන සියලු දේ කිරීමේ බලය අරමුදලෙහි නාමයෙන් මණ්ඩලයට තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මණ්ඩලයට පහත දැක්වෙන බලතල හා කර්තව්‍ය තිබිය යුතු ය:—

(අ) මුදල් සපයා ගැනීම සහ දේශීය හෝ විදේශීය හෝ මූලාශ්‍රවලින්, මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ආ) මේ පනතින් හෝ යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, තෑග්ගක්, තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීම හෝ දැරීම සහ අරමුදලට හිමි වන යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදුදීම, ප්‍රදානය කිරීම, සමර්පණය කිරීම, අන්තිම කැමති පත්‍රයකින් උරුම කිරීම, පවරා දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) අරමුදලේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා ආධාර මුදල්, පරිත්‍යාග මුදල් හෝ දේශීය හෝ විදේශීය ශිෂ්‍යත්ව දීම ;

(ඈ) අරමුදලෙහි අරමුණු වැඩිදුරටත් සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් රැස් කර ගැනීම පිණිස, ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ලොතරැයි පැවැත්වීම ;

(ඉ) අරමුදලේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සඳහා ද, අරමුදලෙහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට, කෙළින් ම හෝ තමන් කාර්යය සඳහා මණ්ඩලය විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන නිලධරයන් සහ සේවකයන් මගින් හෝ අනුයෝජිතයන් මගින් හෝ එළඹීම හෝ එම ගිවිසුම් හෝ එකඟවීම් ඉටු කිරීම ;

(ඊ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අරමුදලෙහි නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම හා ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීම ද, ස්වකීය සේවා නියුක්තයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය කිරීම හා ඔවුන්ට නිවාඩු දීම හා වෙනත් ප්‍රතිලාභ සැලසීම ද පිළිබඳව රීති සෑදීම ;

(උ) අරමුදලට අයිති හෝ අරමුදල විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් තැනීම හෝ තැනීමට සැලැස්වීම ;

(ඌ) භාර මුදල් ඇතුළුව මුදල් ආයෝජනය කිරීම සඳහා නීතියෙන් බලය දී ඇති යම් ආයෝජනවල, මණ්ඩලයේ අභිමතය පරිදි, අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම සහ ඒ ආයෝජනය, මණ්ඩලයේ අභිමතය පරිදි, ආපසු ලබා ගැනීම, නැවත ආයෝජනය කිරීම හා වෙනස් කිරීම හා ඒ ආයෝජනවලින් උපචිත ආදායම ලබා ගැනීම ;

(එ) අරමුදලේ කාර්යයන් සඳහා, බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම හා අරමුදලේ දේපළ ඇපයක් ඇතිව හෝ එවැනි ඇපයක් නැතිව හෝ මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ; සහ

(ඒ) අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා ආනුෂංගික වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

**7.** අරමුදල වෙත— අරමුදලට කරනු ලබන ගෙවීම්.

(අ) ලබාගන්නා ලද යම් මුදල් හෝ දේශීය වශයෙන් හෝ විදේශ වලින් ලැබුණා වූ ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග හෝ උපලබ්ධිත හෝ එකතුකර ගන්නා ලද මුදල් ;

(ආ) අරමුදලෙහි අරමුණු සහ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා කලින් කල ආණ්ඩුවෙන් ලැබෙන යම් ආධාර මුදල් ; සහ

(ඇ) ආයෝජනවලින් ලැබෙන ආදායම් හෝ අරමුදල වෙත ලැබිය යුතු වෙනත් මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

**8.** අරමුදලෙන්— අරමුදලෙන් කරන ලබන ගෙවීම්.

(අ) අරමුදල ක්‍රියාත්මක කිරීම, පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වියදම් ; හා

(ආ) නිලධරයන්ට, සේවකයන්ට සහ වෙනත් සේවානියුක්ත යන්ට වැටුප් ; සහ

(ඇ) අරමුදලෙහි පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවෙහි පවතින, එකී අරමුදලෙහි සියලු ගිවිසුම්, එකඟවීම්, ණය සහ බැරකම්, මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවෙහි ගිවිසුම්, එකඟවීම්, ණය සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය. භාර අරමුදලෙහි ගිවිසුම් ආදිය සංස්ථාවේ ගිවිසුම් ආදිය ලෙස සලකනු ලැබිය යුතු බව.

**10.** (1) මණ්ඩලය විසින් අරමුදලේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යාමට සැලැස්විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස්එක් වන දින පවත්නා පරිදි, ස්වකීය ගිණුම් පොත් පාලනය කිරීම ද ඒ දිනය තෙක් සකස් කරන ලද, අරමුදලෙහි ආදායම් සහ වියදම් ද පිළිබඳ ගිණුමක් සහ එදින දක්වා වූ වත්කම් හා බැරකම් පිළිබඳ සාරාංශයක් ඇතුළත් ශේෂ පත්‍රයක් ඊළඟ මාර්තු මස තිස්එක් වන දිනට පෙර පිළියෙල කරවීම ද මණ්ඩලය විසින් කළ යුතු ය.

(3) ආදායම් සහ වියදම් ගිණුම සහ ශේෂ පත්‍රය අත්සන් කිරීමට මණ්ඩලය විසින් යෝජනා සම්මුතියකින් බලය පවරන ලද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් ඒවා අත්සන් කළ යුතු ය.

(4) විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව අරමුදලෙහි ගිණුම් වර්ෂයක් පාසා විගණනය කළ යුතු ය.

අරමුදලෙහි මුදල් වර්ෂය.

**11.** අරමුදලෙහි මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ඇතැම් තීරු බදුවලින් සහ ආනයන බදුවලින් අරමුදල නිදහස් කිරීම.

**12.** (1) අරමුදලෙහි අරමුණු සහ පරමාර්ථ ඉෂ්ට කර ගැනීමේ කාර්යය සඳහා ආනයනය කරනු ලබන යම් භාණ්ඩ සම්බන්ධයෙන් තීරු බදුවලින් සහ ආනයන බදුවලින් ද අරමුදල නිදහස් විය යුතු ය.

(2) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දකින් හෝ ධන බද්දකින් අරමුදල නිදහස් විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් අරමුදල වෙත තෑග්ගක් පිරිනමනු ලැබූ අවස්ථාවක, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ තෑගි බද්දෙන් එම තෑග්ගේ මූල්‍ය වටිනාකමෙහි ප්‍රමාණයට, ඒ තැනැත්තා නිදහස් විය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් 1980 අප්‍රේල් මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ දී අරමුදල වෙත පරිත්‍යාගයක් කරනු ලැබූ අවස්ථාවක, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා, එම පරිත්‍යාගය අනුමත වියදමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පරිත්‍යාගයේ මූල්‍ය වටිනාකම වෙනුවෙන්, ඒ පනත යටතේ සහනය ලැබීමට ඒ ත්‍යාග දායකයාට හිමිකම තිබිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත, මහා නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත යටතේ ගෙවිය යුතු යම් වරිපනම් බදුවලින් සහ බදුවලින් අරමුදල නිදහස් විය යුතු ය.

(6) අවස්ථාවෝචිත පරිදි, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතෙහි, රේගු ආඥාපනතෙහි, 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතෙහි, මහා නගර සභා ආඥාපනතෙහි හෝ නගර සභා ආඥා පනතෙහි පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද මේ වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

මේ පනත යටතේ කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන් සහ අරමුදලේ නිලධරයන් ආදීන් ආරක්ෂා කිරීම.

**13.** (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ මේ පනතේ කාර්යයන් සඳහා පත් කරනු ලැබූ, අරමුදලේ යම් නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින්, මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට, සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ නියෝජිතයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නො ලැබිය යුතු ය.

(2) අරමුදල විසින් හෝ එයට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අරමුදල විසින් දරනු ලැබූ යම් වියදමක්, අරමුදලෙන් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අරමුදල වෙත ගෙවනු ලබන හෝ අරමුදල විසින් අයකර ගනු ලබන යම් නඩු ගාස්තු කිසිවක් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට, කරනු ලැබූ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට

විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරනු ලැබූ යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බව අධිකරණය තීරණය කළහොත්, ඒ වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකරගෙන තිබේ නම් හැර, අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

**14.** අරමුදලට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී, පෞද්ගලික විෂයෙන් මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ අරමුදලෙහි යම් නිලධරයකුට, සේවකයකුට හෝ නියෝජිතයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් කරනු නො ලැබිය යුතු ය.

පෞද්ගලික වශයෙන් මණ්ඩලයෙහි සාමාජිකයකුට හෝ අරමුදලේ නිලධරයන් ආදීන් ට විරුද්ධව හෝ ඔවුන් ගේ දේපළවලට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**15.** අරමුදලේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අරමුදලෙහි නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස දණ්ඩ නීති සංග්‍රහය යටතේ සැලකෙන බව.

**16.** අරමුදල, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල, උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

**17.** ඔප්පුවෙහි කුමක් සඳහන්ව ඇත ද, ඒ නොතකා මේ පනතෙහි විධිවිධාන බලපැවැත්විය යුතු ය. ඒ අනුව, මේ පනතෙහි විධිවිධාන සහ ඔප්පුවෙහි විධිවිධාන අතර යම් ගැටුමක් පවතින විට, මේ පනතෙහි විධිවිධාන බලපැවැත්විය යුතු ය.

ඔප්පුවේ විධිවිධාන අභිබවා මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හෝ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**19.** මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

"ප්‍රාරම්භක" යන්නෙන් ඔප්පුවේ පූර්විකාවෙහි පළමුව සඳහන් ඡන්දයේ සඳහන් තැනැත්තා අදහස් වන අතර, ඔහුගේ මරණයෙන් පසු, වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයා අදහස් වන්නේ ය.

උපලේඛනය

අංක 2773

මෙය, එක් පාර්ශ්වයකට (මෙහි මින් මතු ප්‍රාරම්භක යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන) ගරු. ලලිත් විලියම් ඇතුලත්මුදලි සහ අනෙක් පාර්ශ්වයට (මෙහි මින් මතු "වත්මන් භාරකරුවන්" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන) (1) නෙවිල් ඩන්බර් මීරගහවත්ත සමරකෝන් (2) වීරවාගු සිවසුප්‍රමනියම් (3) ෆීලික්ස් ස්ටැන්ලි ක්‍රිස්ටෝපර් පෙරේරා කල්පගේ (4) එරික් ජැක්සන් ද සිල්වා (5) විදානලාගේ ලක්ෂ්මන් ප්‍රසාද් ද මැල් සහ (6) ජේසීමා ඉස්මයිල් අතර එක් දහස් නවසිය අසූ එකක් වූ පෙබරවාරි මස 23 වන දින ඇතුලත් වූ භාර ඔප්පුවයි.

ප්‍රාරම්භක, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව විසින් තෝරා පත් කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන හෙයින් සහ, වෙළෙඳ හා නාවික කටයුතු අමාත්‍ය ධුරය දැනට දරන හෙයින් ද;

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නංවාලීමේ අවශ්‍යතාව තමාගේ පෞද්ගලික අවබෝධය හා අත්දැකීම මගින් ප්‍රාරම්භක, විශේෂයෙන් ම දැන සිටින අතර අධ්‍යාපනය නංවාලීම දැනට පවත්නා දරිද්‍රතා පිළිබඳ ගැටලුවලින් අත්මිදීමේ මාර්ගයක් ලෙස ඔහුට පෙනී යන හෙයින් ද;

තවද, එකී ශ්‍රී ලංකා ජනරජයෙහි පවත්නා මිනිස් හැකියාවන් පිළිබඳව අවබෝධයක් ඇති ප්‍රාරම්භක විසින් එකී ශ්‍රී ලංකා ජනරජයේ සහ එහි ජනතාවගේ වැඩි වාසිය සහ යහපත උදෙසා එම සම්පත් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව දක්නා ලද හෙයින් ද;

තමාගේ සහ තම රටේ යහපත පිණිස, තමාගේ පූර්ණ හැකියාව වර්ධනය කර ගැනීමට එක් එක් පුද්ගලයාට උපකාර කිරීමට අවශ්‍ය බව ප්‍රාරම්භකට ප්‍රබල ලෙස හැඟී ගොස් තිබෙන හෙයින් ද;

තවද, ස්වකීය පෞද්ගලිකත්වයේ ගරුත්වය තුළින් ශක්තිය ලබා ගැනීම සඳහා ජනතාවට මාර්ගය සලසා නොදී සහ දියුණු ජීවන රටාවක් හා උසස් ජීවන මට්ටමක් පිළිබඳ වැඩි වැටහීමක් සඳහා අවස්ථාව සලසා නොදී නියම සහ අර්ථවත් සංවර්ධනයක් ඇතිවිය නොහැකි බව ප්‍රාරම්භකට ඒත්තු ගොස් ඇති හෙයින් ද;

තවද, ශ්‍රී ලංකාවේ අගහිගකම්වලින් පෙළෙන තැනැත්තන්ට යහපත සැලසීම උදෙසා, මහපොළ වැඩපිළිවෙල යනුවෙන් හඳුන්වනු ලබන වැඩ පිළිවෙළක් ප්‍රාරම්භක විසින් 1980 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ගම්බද ප්‍රදේශවල ආරම්භ කර ඇති හෙයින් ද;

තවද, අධ්‍යාපනය සැලසීම සඳහා ප්‍රාරම්භක විසින් රජයෙන් හා මහජනයාගෙන් මුදල් ලබා ගෙන, මෙහි දක්වා ඇති පරමාර්ථ ඉෂ්ට කර ගැනීම පිණිස, "මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවීම පිණිස අවශ්‍ය අවසරය ලබාගෙන ඇති හෙයින් ද;

තවද, ආධාර ලැබීමට සුදුසු ශිෂ්‍යයින්ට, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ/හෝ, උසස් අධ්‍යාපනය සහ/හෝ කාර්මික සහ/හෝ තාක්ෂණික සහ/හෝ වෘත්තීය නිපුණතා සහ ප්‍රවීණතා වැඩි දියුණු කර ගැනීම පිණිස, ශිෂ්‍යත්ව සහ වෙනත් අධ්‍යාපන පහසුකම් සැලසීමට ප්‍රාරම්භක කැමැත්තෙන් සිටින හෙයින් ද, මෙහි මින් මතු එයි විධාන සලසා ඇති ආකාරයට, එකී උපපාදනය කළමනාකරණය කිරීම පිණිස භාරකරුවන් ලෙස ක්‍රියා කිරීමට වත්මන් භාරකරුවන් එකඟ වී සිටින හෙයින් ද;

මේ භාර ඔප්පුවෙන් පහත දැක්වෙන පරිදි කියා සිටී:—

1. භාරය පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පරමාර්ථ සඳහා ය:—

(අ) තම ද්විතීය අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති සහ තම විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ /හෝ උසස් අධ්‍යාපනය සහ/හෝ කාර්මික

සහ/හෝ තාක්ෂණික සහ/හෝ වෘත්තීය නිපුණතා සහ ප්‍රවීණතා දියුණු කර ගැනීමට බලාපොරොත්තු වන, ආධාර ලැබීමට සුදුසු ශිෂ්‍යයන්ට වර්ෂ පතා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ආ) අධ්‍යාපන ආයතන, පාසල්, පදනම් සහ ඒ සමාන ආයතන පිහිටුවීම සහ/හෝ පිහිටුවීමට සහාය වීම සහ/හෝ ඒවා කළමනාකරණය කිරීමට සහ පවත්වා ගෙන යාමට සහාය වීම;

(ඇ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සැලසීමේ ලා නිරතව සිටින ගුරුවරුන්ගේ, කථිකාචාර්යවරුන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ ප්‍රවීණතා වර්ධනය කිරීම සහ/හෝ වැඩි දියුණු කිරීම;

(ඈ) පරමාර්ථ ඉෂ්ට කර ගැනීම පිණිස අවශ්‍ය වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

2. මෙහි පහත දක්වා ඇති බලතලවලට සහ විධිවිධානවලට යටත්ව, භාරකරුවන් විසින් විශ්වසනීය භාරයට ගෙන දැරීම පිණිස ද, පාවිච්චි කරනු ලැබීම පිණිස ද මුදලින් රුපියල් දසදහසකින් (රු. 10,000) සමන්විත අරමුදල ප්‍රාරම්භක විසින් භාරකරුවන් වෙත මෙයින් භාර දෙනු ලැබේ.

3. මෙම වගන්ති ක්‍රියාත්මක කළ යුතු ආකාරය සහ ක්‍රමය ද මෙහි දක්වා ඇති ශිෂ්‍යත්ව හෝ පහසුකම් තිබිවක් පිරිනැමීම හෝ ප්‍රදානය කිරීම පිළිබඳව ද නියම කරමින් භාරකරුවන් විසින් රීති සහ අතුරු ව්‍යවස්ථා සෑදිය යුතු ය.

4. භාර අරමුදලෙහි ආදායම ප්‍රමාණවත් නම්, භාරකරුවන් විසින් සුදුසු යයි ඔවුන් සිතන ශිෂ්‍යත්ව ප්‍රමාණයක් පිරිනැමීම ද, එසේ සුදුසු යයි සිතන පහසුකම් සැලසීම ද කරනු ලැබිය හැකි අතර, එම ශිෂ්‍යත්ව සඳහා සහ පහසුකම් සඳහා, සිය අභිමතය පරිදි සුදුසු යයි ඔවුන් සලකන කාලසීමා නියම කිරීම සහ මුදල් ලබාදීම, එම ශිෂ්‍යත්ව සඳහා සහ පහසුකම් සඳහා නම් නියම කිරීම ද කරනු ලැබිය හැකි ය.

5. තම අභිමතය පරිදි සුදුසු යයි අදහස් කරනු ලබන සුරැකුම්පත්වල සහ සුදුසු යයි තමන් සලකන පරිදි ඉඩම් අත්කර ගැනීම සහ දැරීම සඳහා භාරකරුවන් විසින් භාර අරමුදල ආයෝජනය කරනු ලැබිය හැකි ය.

6. වඩාත් වාසි සැලසෙන පරිදි භාරකරුවන් විසින් භාර අරමුදලේ ආදායමෙන්, මෙම උපපාදනය කළමනාකරණය කළ යුතු ය.

7. භාර අරමුදලට දායක වන ලෙස එම පරිත්‍යාග, උපපාදන, තෑගි සහ සමාන දෑ පිළිගන්නා ලෙස භාරකරුවන් විසින් යම් මණ්ඩලයකට හෝ පුද්ගලයකුට හෝ සංවිධානයකට ආරාධනා කරනු ලැබිය හැකි ය.

8. මේ භාරය පවත්වා ගෙන යාමේ කාර්ය සඳහා, භාර දේපළ ඇපයක් ලෙස තබා මුදල් ණයට ලබා ගැනීමේ බලය භාරකරුවන්ට තිබිය යුතු ය.

9. ප්‍රාරම්භක ද, ඔහු ජීවත්ව සිටින තාක් කල්, මේ වගන්ති යටතේ භාරකරුවකු විය යුතු අතර, ඔහු මියගිය විට හෝ ඔහු විසින් පවරා දීමෙන් පසුව, ඔහු විසින් නම් කරනු ලැබ ඇති පැවරුම්ලාභී හෝ උරුමක්කරු ඔහු වෙනුවට ආදේශ කරනු ලැබිය යුතු ය.

10. යම් භාරකරුවකු බංකොලොත් භාවයට පත් වුවහොත් හෝ චරිත දූෂණය සම්බන්ධ වරදකට අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබුවහොත් හෝ වුන්මත්ත වුවහොත් හෝ හය මාසයක් වූ අඛණ්ඩ කාලයක් ශ්‍රී ලංකා ජනරජයෙන් බැහැරව සිටියහොත් හෝ ශාරීරික වශයෙන් අශක්තතාවකට පත් වුවහොත්, සෙසු භාරකරුවන් විසින්, ප්‍රාරම්භක භාරකරුවකුව සිටින තාක් කල් ඔහුගේ එකඟත්වය ද ඇතිව, ආදේශකයකු පත් කළ යුතු ය.

11. පහත නම් සඳහන් වන්මින් භාරකරුවන්, මෙහි පහත ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති තනතුරු සහ/හෝ පදවිනාම දරන තාක් කල්, පෙර කී පරිදි කලින් අන්‍යාකාර තීරණයක් කරනු ලැබුවහොත් මිස, එකී වගන්ති යටතේ භාරකරුවන් ලෙස ඉදිරියටත් ක්‍රියා කළ යුතු ය :—

(අ) නෙවිල් ඩන්බර් මිරහවත්ත සමරකෝන් ; ඔහු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්චයකාර තනතුර සහ/හෝ එම පදවි නාමය දරන තාක් කල් ;

(ආ) එරික් ජැක්සන් ද සිල්වා ; ඔහු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තනතුර සහ/හෝ එම පදවි නාමය දරන තාක් කල් ;

(ඇ) ෆ්‍රෙඩ්රික් ස්ටැන්ලි ක්‍රිස්ටෝපර් පෙරේරා කල්පගේ ; ඔහු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති තනතුර සහ/හෝ එම පදවි නාමය දරන තාක් කල් ;

(ඈ) විදානලාගේ ලක්ෂ්මන් ප්‍රසාද් ද මැල් ; ඔහු වෙළෙඳ හා නාවික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තනතුර සහ/හෝ එම පදවි නාමය දරන තාක් කල් ;

එකී තැනැත්තා විසින් ඉහත සඳහන් තනතුර සහ/හෝ පදවි නාමය දැරීම අවසන් වූ අවස්ථාවක, මේ වගන්තිය යටතේ ඔහු භාරකරුවකු ව සිටීම ද අවසන් විය යුතු ය.

12. පෙර කී පරිදි කලින් අන්‍යාකාර තීරණයක් කරනු ලැබුවහොත් මිස, පහත නම් සඳහන් වන්මින් භාරකරුවන්, ඔවුන් ජීවත්ව සිටින තාක් කල්, මේ ප්‍රදාන පත්‍ර යටතේ ඉදිරියටත් භාරකරුවන් විය යුතු අතර, ඔවුන් මියගිය විට හෝ සවරා දීමෙන් පසුව හෝ මේ වගන්ති යටතේ ඔවුන් භාරකරුවන්ව සිටීම අවසන් විය යුතු ය.

අ/ක. එන්. ඩී. එම්. සමරකෝන්

අ/ක. වී. සිවසුබ්‍රමනියම්

අ/ක. එෆ්. සී. එස්. පී. කල්පගේ

අ/ක. එරික් ජැක්සන් ද සිල්වා

අ/ක. ලලිත් ඩබ්ලිව්. ඇතුලත්මුදලි

අ/ක. ඩබ්ලිව්. ලක්ෂ්මන් පී. ද මැල්

අ/ක. ජේසීමා ඉස්මයිල්

13. එන්මින් භාරකරුවන් හෝ ඔවුන්ගෙන් කිසිවකු හෝ මේ වගන්ති යටතේ භාරකරුවන්ව සිටීම හෝ භාරකරුවකු ව සිටීම අවසන් වූ අවස්ථාවක, ප්‍රාරම්භකයා විසින්, ඔහු ජීවත්ව සිටින තාක් කල්, එම භාරකරු වෙනුවට ආදේශකයකු පත් කළ යුතු ය. භාරකරුවකු පත් කිරීමේ තම අයිතිය ප්‍රාරම්භක විසින් අන්තිම කැමති පත්‍රයක් මඟින් වෙනත් කෙනකුට පවරනු ලැබිය හැකි ය. එසේ එවැනි පැවරීමක් කරනු ලැබ නොමැති අවස්ථාවක, ආදේශක භාරකරුවකු පත් කිරීමේ අයිතිය ඉතිරි භාරකරුවන් විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

14. භාර දේපළ පාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යය භාරකරුවන් සතු විය යුතු ය.

15. භාරකරුවන් අතර මතභේදයක් පවතින අවස්ථාවක, භාරය පිළිබඳව භාරකරුවන්ගේ බහුතර තීරණය අනුගමනය සහ බලසහිත විය යුතු අතර, එය ක්‍රියාත්මක කළ යුතු ය.

16. භාරයේ පරමාර්ථ නොපැවතීම නිසා හෝ භාරය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා හෝ භාරයේ කටයුතු ව්‍යර්ථ වූ අවස්ථාවක, භාරයේ ඉතිරි මුදල් සමාන පරමාර්ථ සඳහා යොදා ගැනීම සඳහා භාරකරුවන් විසින් නිසි බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලීමක් කළ යුතු ය.

17. භාරකරුවන් වංචා කිරීම් සම්බන්ධයෙන් වරදකරුවන් වුවහොත් මිස, භාර දේපළවලට සිදුවන යම් හානියක් සම්බන්ධයෙන් භාරය කිසිම විටක වගනොකිව යුතු ය.

18. මෙය පොදු පුණ්‍ය භාරයක් වන හෙයින්, භාරයේ දේපළ කිසිම හේතුවක් නිසා හෝ ප්‍රාරම්භකට හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයන්ට හෝ පැවරුම්ලාභීන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට ආපසු හිමි නොවිය යුතු ය.

19. අරමුදලෙහි යම් කොටසක් හෝ ඉන් ලැබෙන ආදායම හෝ මෙයින් ඇති කරනු ලබන භාරයේ කාර්යයන් නොවන වෙනත් කිසිම කාර්යයක් සඳහා උපයෝගී කර නොගත යුතු ය.

මීට සාක්ෂි වශයෙන්, ඉහත සඳහන් පාර්ශ්වකරුවන් විසින් එක් දහස් නවසිය අසූ එකක් වූ (1981) පෙබරවාරි මස විසිතුන් වන දින මේ ලියවිල්ලට ද මේ සමගම ඇති තවත් ලියවිලි දෙකකට ද අත්සන් තබන ලදී.

අප ඉදිරියේ අත්සන් තබන ලදී. මෙයි අත්සන් තැබූ තැනැත්තන් අප හොඳාකාර දන්නා බවත්, ඔවුන්ගේ නියම නම්, රැකියා සහ පදිංචි ස්ථාන දන්නා බවත් අපි ප්‍රකාශ කර සිටිමු.

අ/ක. එන්. ඩී. එම්. සමරකෝන්
අ/ක. වී. ශිවසුබ්‍රමනියම්
අ/ක. එෆ්. සී. එස්. පී. කල්පගේ
අ/ක. එරික් ජැක්සන් ද සිල්වා
අ/ක. ලලිත් ඩබ්ලිව්. ඇතුලත්මුදලි
අ/ක. ඩබ්ලිව්. ලක්ෂ්මන් පී. ද මැල්
අ/ක. ජෙසීමා ඉස්මයිල්

අ/ක. එම්. එච්. පී. පෙරේරා.
ප්‍රසිද්ධ නොතාරිස්.

1. අ/ක. ජේ. ආර්. ජයවර්ධන
2. අ/ක. ආර්. ප්‍රේමදාස.

මෙයට සාක්ෂිකරුවන් වශයෙන් පිළිවෙළින් "ජේ. ආර්. ජයවර්ධන" යනුවෙන් සිංහලෙන් අත්සන් තැබූ ගරු ජූනියස් රිචඩ් ජයවර්ධන සහ ගරු රණසිංහ ප්‍රේමදාස ඉදිරිපිට දී පිළිවෙළින් "(1) නෙවිල් ඩන්බර් මිරහවත්ත සමරකෝන්, (2) වීරවාගු ශිවසුබ්‍රමනියම්, (3) එෆ්. සී. පී. කල්පගේ" යනුවෙන් ද, (4) සිංහලෙන්, සහ (5) සිංහලෙන් අත්සන් තැබූ, (1) නෙවිල් ඩන්බර් මිරහවත්ත සමරකෝන්, (2) වීරවාගු ශිවසුබ්‍රමනියම්, (3) ෆිලික්ස් ස්ටැන්ලි ක්‍රිස්ටෝපර් පෙරේරා කල්පගේ, (4) එරික් ජැක්සන් ද සිල්වා, සහ (5) ලලිත් විලියම් ඇතුලත්මුදලි යන මෙහි නම් සඳහන් අත්සන්කරුවන්ට ඉහත සඳහන් සාධන පත්‍රය යථා පරිදි කියවන ලදුව, මා දන්නා හඳුනන එකී සියලු අත්සන්කරුවන් විසින් ද, එකී සාක්ෂිකරුවන් විසින් ද, එකී නොතාරිස් වන මා විසින් ද මා ඉදිරිපිට දී සහ එකිනෙකා ඉදිරිපිට දී එක් දහස් නව සිය අසූ එකක් වූ (1981) පෙබරවාරි මස විසිතුන් වන දින (23) කොළඹ දී සියලු දෙනාම පැමිණ සිටි එකම අවස්ථාවේ දී, එකී සාධන පත්‍රයට අත්සන් තබන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසිද්ධ නොතාරිස්, මල්ලවාරච්චිගේ හර්මන් පැට්‍රික් පෙරේරා වන මම මෙයින් සහතික කරමි.

තව ද, ඉහත සඳහන් සාධන පත්‍රය කියවා පෙර කී පරිදි අත්සන් තැබීමට පෙර, මුල් පිටපත සහ අනුපිටපත යන පිටපත් දෙකෙහි ම, 5 වන පිටුවේ 4 වන පේළියෙහි "බයි" යන වචනයෙහි "වයි" අක්ෂරය ද, 26 වන පේළියෙහි "ඔර්" යන වචනයෙහි "ආර්" යන අක්ෂරය ද, 30 වන පේළියෙහි "වූ" යන වචනය ද මකා හැර ඒ මත නැවත යතුරු ලියන ලද බව මම සහතික කර සාක්ෂි දරමි.

මේ සාධන පත්‍රයේ අනුපිටපත රුපියල් 10 ක් වටිනා මුද්දරයක් ද මුල් පිටපත රුපියල් 1 ක් වටිනා මුද්දරයක් ද දරන බවත් එකී මුද්දර මා විසින් සපයන ලද බවත් මම අවසාන වශයෙන් සහතික කරමි.

මෙසේ සහතික කරන්නේ,

අ/ක. එම්. එච්. පී. පෙරේරා,
ප්‍රසිද්ධ නොතාරිස්.

සහතික කළ දිනය
1981 පෙබරවාරි මස 23.

සාක්ෂිකරුවෝ—

අ/ක. ඩී. එන්. මද්දුමගේ
අ/ක. සෝ. ධර්මසේන

අ/ක. ඩබ්ලිව්. ලක්ෂ්මන් පී. ද මැල්
අ/ක. ජෙසීමා ඉස්මයිල්

අ/ක. එම්. එච්. පී. පෙරේරා,
ප්‍රසිද්ධ නොතාරිස්.

මුළිවෙලින් "ඩී. එන්. මද්දුමගේ" සහ "සෝ. ධර්මසේන" යනුවෙන් මීට සාක්ෂිකරුවන් ලෙස අත්සන් තබන ලද පාදුක්කේ, මාදාගමුවාවේ දොන් නොරිස් මද්දුමගේ සහ රාජගිරියේ, ඔබේසේකර පුර අංක 78, කුඹුරේගමගේ ධර්මසේන ඉදිරිපිට දී මෙහි සඳහන් අත්සන්කරුවන් වන, නොපැහැදිලි ලෙස අත්සන් තබා ඇති (5) විදානලාගේ ලක්ෂ්මන් ප්‍රසාද් ද මැල් විසින් සහ "ජෙසීමා ඉස්මයිල්" යනුවෙන් අත්සන් තබා ඇති (6) ජෙසීමා ඉස්මයිල් විසින් ඉහත සඳහන් සාධන පත්‍රය යථා පරිදි කියවන ලදුව, මා දන්නා හඳුනන එකී සියලු අත්සන්කරුවන් විසින් ද එකී සාක්ෂිකරුවන් විසින් ද, එකී නොතාරිස් වන මා විසින් ද, මා ඉදිරිපිට දී සහ එකිනෙකා ඉදිරිපිට දී එක් දහස් නව සිය අසූ එකක් වූ (1981) ජූනි මස විසි නව (29) වන දින කොළඹ දී සියලු දෙනාම පැමිණ සිටි එකම අවස්ථාවේ දී එකී සාධන පත්‍රයට අත්සන් තබන ලද බව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසිද්ධ නොතාරිස්, මල්ලවාරච්චිගේ හර්මන් පැට්‍රික් පෙරේරා වන මම මෙයින් සහතික කරමි.

මෙසේ සහතික කරන්නේ,

අ/ක. එම්. එච්. පී. පෙරේරා,
ප්‍රසිද්ධ නොතාරිස්.

සහතික කළ දිනය: 1981 ජූනි මස 29 වන දින.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 60 කි. (විදේශීය) රු. 80 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.